# කැලණිය අධ්‍යාපන කලාපය
## මධ්‍ය වාර පරීක්ෂණය - 2015
## ඉතිහාසය - 06 ශ්‍රේණිය
### I කොටස

නම

කාලය පැය 02 යි.

ශ්‍රේණිය

---

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

1. ඉතිහාසය පිළිබඳ දැනුම ලබා ගැනීමට උපකාරී වන දේ හැඳින්වීමට භාවිතා කරන පොදු නම කුමක්ද
   1 ජන ප්‍රවාද　　2 මූලාශ්‍රය
   3 සාහිත්‍ය මූලාශ්‍රය　　4 පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය
2. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් අපට ලැබෙන ප්‍රධානතම ප්‍රයෝජනය වන්නේ
   1 අතීතය දැන ගැනීමට ලැබීමයි
   2 රජවරුන් පිළිබඳ දැන ගැනීමට ලැබීමයි
   3 අතීත අත්දැකීම් තුලින් වර්තමානය හා අනාගතය සකසා ගැනීමට හැකි වීමයි.
   4 අනාගතයට පුරෝකතන ඉදිරිපත් කිරීමට හැකි වීමයි.
3. ඔබේ පාසලේ ඉතිහාසය ඉගෙන ගැනීමේදී වඩාම ප්‍රයෝජනවත් මූලාශ්‍රය කුමක්ද
   1 සමරු ඵලක　　2 ගොඩනැගිලි
   3 ඇතුලත්වීමේ ලේඛන　　4 ලොග් පොත
4. ගෞතම පුත්‍ර සාතකර්ණි රජුගේ යුධ ජයග්‍රහණය සිහි කරමින් ආරම්භ කර ඇති වර්ෂ ක්‍රමය වන්නේ
   1 බුද්ධ වර්ෂ ක්‍රමය　　2 ක්‍රිස්තු වර්ෂ ක්‍රමය
   3 හිජ්රි වර්ෂ ක්‍රමය　　4 ශක වර්ෂ ක්‍රමය
5. පෘථිවිය නිර්මාණය වීම පිළිබඳ පොදු මතය වන්නේ
   1 දූවිලි වළාවක් හෙවත් නීහාරිකාවකින් නිර්මාණය වූ බවයි.　　2 දෙවියන් විසින් මැවූ එකක් බවයි.
   3 ජලය ඝන බවට පත් වීමෙන් නිර්මාණය වූ බවයි.　　4 ගිනි කන්දක් සිසිල්වීමෙන් නිර්මාණය වූ බවයි.
6. පෘථිවියේ මධ්‍ය කොටසේ උෂ්ණත්වය සාමාන්‍යයෙන්
   1 සෙල්සියස් අංශක 11 000 ක් පමණ වේ.　　2 සෙල්සියස් අංශක 50 000 ක් පමණ වේ.
   3 සෙල්සියස් අංශක 6 000 ක් පමණ වේ.　　4 සෙල්සියස් අංශක 30 000 ක් පමණ වේ.
7. අප ජීවත් වන පෘථිවියේ මුල්ම ජීවීන් බිහිවීම සිදු වූයේ
   1 වායුගෝලයේ ය　　2 ජලයේ ය
   3 ගොඩබිමය　　4 පෘථිවි අභ්‍යන්තර ලාවා කොටසේය
8. මිනිසෙක් වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා හැඳින්වෙන්නේ
   1 හෝමෝ හැබිලිස් නමිනි.　　2 හෝමෝ නියැන්ඩතාලෙන්සිස්
   3 හෝමෝ සාපියන් නමිනි.　　4 ඔස්ට්‍රලෝපිතිකස් නමිනි.

9. මිනිසා පළමු වරට ගින්දර භාවිතය පිළිබඳ සාක්ෂි ලැබී ඇත්තේ කුමන රටින්ද

1 ඊශ්‍රායලය 2 ජර්මනිය

3 චීනය 4 ඉන්දියාව

10. ආදි මානවයා දුනු ඊතල භාවිතා කරමින් දඩයම් කිරීම ආරම්භ වූයේ

1 පූර්ව ශිලා යුගයේය 2 මධ්‍ය ශිලා යුගයේය

3 නව ශිලා යුගයේය 4 ගොවි යුගයේය

11. වී වගාව මුල් වරට ආරම්භ වූ රට කුමක්ද

1 ජපානය 2 ඉන්දියාව

3 චීනය 4 ඕස්ට්‍රේලියාව

12. මෙසපොටේමියා ශිෂ්ටාචාරයේ සිගුරාට් නමින් හඳුන්වා ඇත්තේ

1 කෘෂි කටයුතු කළ ගොවිබිම්ය 2 මළවුන් වල දැමූ ස්ථානයන්ය

3 දෙවියන්ට පූජා පැවැත්වූ දේවාලය 4 නාවික කටයුතු සඳහා භාවිතා කළ යාත්‍රාය

13. මළසිරුරු කල් තබා ගැනීම සඳහා මමීකරන ක්‍රමය ලෝකයට හඳුන්වා දෙන ලද්දේ කුමන ශිෂ්ටාචාර වැසියන්ද

1 මෙසපොතේමියා ශිෂ්ටාචාර වැසියන් 2 ඊජිප්තු ශිෂ්ටාචාර වැසියන්

3 හොවැංහෝ ශිෂ්ටාචාර වැසියන් 4 ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන්

14. විජය කුමරු ඇතුළු පිරිස මෙරටට පැමිණ ඇත්තේ

1 ක්‍රි.පූ. 544 දී පමණය. 2 ක්‍රි.ව. 544 දී පමණය.

3 ක්‍රි.පූ. 240 දී පමණය. 4 ක්‍රි.ව. 240 දී පමණය.

15. ලංකාවට විජය කුමරු හා පිරිස පැමිණීමෙන් පසු

1 ලංකාව ඉන්දියාවට යටත් කර ගැනීම සිදු විය.

2 ඉන්දියාවේ පාලන ක්‍රමය මෙරට ක්‍රියාත්මක විය

3 ඉන්දියාවේ සිරිත් විරිත් ලංකාවේ පැතිරීම සිදු විය.

4 යක්ෂ ගෝත්‍රිකයින් විනාශ කොට කුවේණිය රජ කරවීම සිදු විය.

16. පැරණි නගර නිර්මාණයේදී නගරය වටා දිය අගලක් සෑදීමෙන් බලාපොරොත්තු වූයේ

1 නගරයේ ආරක්ෂාව සැලසීමයි 2 නගරය අලංකාර කිරීමයි

3 නගර වැසියන්ට අවශ්‍ය ජලය සැපයීමයි 4 රජ මාළිගයට අවශ්‍ය ජලය ලබා ගැනීමයි

17. මිහිඳු හිමියෝ දේවානම්පියතිස්ස රජුගෙන් ප්‍රශ්න ඇසීම සිදු කළේ

1 අඹ ගස් පිළිබඳ දැන ගැනීමටය 2 රජු පිළිබඳ තොරතුරු දැන ගැනීමටය

3 රජුගේ බිය දුරු කිරීම සඳහාය 4 රජුගේ බුද්ධිමත්භාවය පරීක්‍ෂා කිරීමටය.

18. ථූපාරාම චෛත්‍යය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද ?

1 වර්තමානයේ ථූපාරාම චෛත්‍යය ධාන්‍යාකාර හැඩයෙන් යුක්තය.

2 ථූපාරාම දාගැබෙහි නිධන් කොට ඇත්තේ මිහිඳු හිමියන්ගේ ධාතූන්ය.

3 ථූපාරාම දාගැබේ බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කර තිබේ.

4 ථූපාරාමය වටා වටදාගෙයක් ඉදි කලේ දේවානම් පියතිස්ස රජතුමාය.

19. අපේ රටේ භික්ෂු ශාසනය ආරම්භ වන්නේ

1 සඟමිත් තෙරණිය වැඩම කිරීමෙන් පසුවය. 2 අරිට්ඨ කුමරු පැවිදි වීමෙන් පසුවය.

3 අනුලා දේවිය පැවිදි වීමෙන් පසුවය. 4 සුමන සාමණේරයන් පැවිදි වීමෙන් පසුවය.

20. සංඝමිත්තා තෙරණින් වහන්සේ රැගත් නැව පැමිණියේ

1. දඹකොළ පටුන වරායටය
2. ඌරා තොට වරායටය
3. මහා තිත්ථ වරායටය
4. ගෝකණ්ණ තිත්ථ වරායටය

## 11 කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

**(1) 1** පහත දැක්වෙන පින්තූර හඳුනාගෙන ඒවායේ නම ඉදිරියෙන් ඇති හිස්තැන් වල ලියන්න (ලකුණු 04 X 2)

A

.....................................

B

.....................................

C

.....................................

D

.....................................

II පහත දැක්වෙන සිතියමේ 1 2 & අංක වලින් දැක්වෙන ශිෂ්ටාචාර හා අංක 04 න් දැක්වෙන රට නම් කරන්න.




(2) I A – ඔපඩිනියාවකුගේ පාෂාණිභූත සලකුනක් සොයාගත් රට කුමක්ද ?

B - ගල් පතුරක් කඩා මුවහත් ආයුධයක් පළමුව සාදාගත් වානරයා හැඳින්වූ නම කුමක්ද ? (ල.02)

II හෝමෝ සාපියන්වරු බෙදෙන වර්ග හතර නම් කරන්න. (ල.04)

III නව ශිලා යුගයේ මිනිසා ලබාගත් ජයග්‍රහණ පහක් සඳහන් කරන්න. (ල.05)

(3) I මෙසපොතේමියානු ශිෂ්ටාචාරය බිහිවූ ගංගා නිම්න දෙක නම් කරන්න. (ල.02)

II මෙසපොතේමියාවේ පැවති සමාජය බෙදී තිබුන කොටස් හතර සඳහන් කරන්න. (ල.04)

III මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයේ පැවති ලේඛන කලාව පිළිබඳ වාක්‍ය හතරක් ලියන්න. (ල.05)

(4) I ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට වර්තමානයේ අයත් වන ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල.02)

II ලෝකයේ මුල් ශිෂ්ටාචාර පිළිබඳ පහත අසා ඇති තොරතුරු ලියා දක්වන්න.

A ඊජිප්තු ශිෂ්ටාචාරයේ රජවරු හැඳින් වූ නම

B පළමු වරට රබර් බෝලයක් නිෂ්පාදනය කළ ශිෂ්ටාචාරය

C මාළිමා යන්ත්‍රය ලෝකයට හඳුන්වා දුන් ශිෂ්ටාචාරය

D ඊජිප්තුවේ ජීවත් වූ ඉතාම රූමත් බිසව (ල.04)

III ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පැවති නගර දෙකක් හා නගරවල පැවති ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල.05)

(5) I ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස වල පදිංචි වූ වැසියන් ආහාර වශයෙන් ගත් ශාක ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල.02)

II මුල් ජනාවාස වල වැසියන් මළමිනී සඳහා අනුගමනය කල චාරිත්‍ර දෙකක් ලියන්න. (ල.04)

III තම නිවාස සකස් කර ගැනීම මුල් ජනාවාස වල වැසියන් කටයුතු කල ආකාරය විස්තර කරන්න. (ල.05)

( 6 ) I පණ්ඩුකාභය කුමරුගේ මව හා පියාගේ නම් ලියන්න. (ල.02)

II පණ්ඩුකාභය රජතුමාගේ චරිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ හතරක් ලියන්න. (ල.04)

III පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය නිර්මාණයේ දී කටයුතු කල ආකාරය විස්තර කරන්න. (ල.05)

( 7 ) I මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ මෙරටට වැඩම කල රහතන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න. (ල.02)

II පහත අසා ඇති තොරතුරු සපයන්න.

A - දාගැබක ආරක්ෂාවට ඉදිකරන ගොඩනැගිල්ල හඳුන්වන නම -

B - දේවානම්පියතිස්ස රජු පූජා කළ මිහින්තලේ ගල්ගුහා හැඳුන්වූ නම -

C ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපනය කළ උයන -

D ලංකාවේ භික්ෂු ශාසනය ආරම්භ කරමින් පැවිදි වූ පුද්ගලයා - (ල.04)

III දේවානම්පියතිස්ස රජතුමාගේ සේවාවන් පිළිබඳ වාක්‍ය හතරක් ලියන්න. (ල.05)